අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
Ministry of Education, Higher Education and Vocational Education - Piriven Education Division
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விப் பிரிவு

# අන්තර් පාරිවේණික සිසු නිපුණතා ඇගයීම - 2025

## දිස්ත්‍රික් වටය

සියලු ම හිමිකම් ඇවිරිණි. All rights reserved. அனைத்து உரிமைகளும் பாதுகாக்கப்பட்டவை.

**කණිෂ්ඨ අංශය** | **පාලි භාෂා හා සාහිත්‍යඥානය** | **කාලය පැය - 03 යි.**

### පිළිතුරු පත්‍රය

01. කෙටි පිළිතුරු සපයන්න.

I. ‘ක, ඛ, ච, ඡ, ට, ඨ, ත, ථ, ප, ඵ, ස

II. **සං + යොගො, අව + නද්ධා**

III. **එතම්හා, එතස්මා / එතෙහි, එතෙහි**

IV. පඤ්චමී ආඛ්‍යාත විභක්තිය, සත්තමී ආඛ්‍යාත විභක්තිය

V. නොයෙක්, ඉදිරියෙහි

VI. පාලි භාෂාවතරණය I, II, III, අභිධර්ම මාතෘකා ස්වරූපය, පාලි නිඝණ්ඩුව, පාලි භාසප්පවෙසනී, පාලි සාහිත්‍යය

VII. බුද්ධඝෝෂ හිමි, බුද්ධදත්ත හිමි

VIII. පාරාජිකාපාළි, පාචිත්තියපාළි, මහාවග්ගපාළි, චුල්ලවග්ගපාළි, පරිවාරපාළි

IX. 4 කි. 8000 කි.

X. බුද්ධමිත්ත හිමි සහ බුද්ධදේව හිමි

*(ලකුණු 2 × 10 = 20යි)*

02 (I) පහත දැක්වෙන ගද්‍ය පද්‍ය කොටස් සිංහලට පරිවර්තනය කරන්න.

ගෘහපති පුත්‍රය, කරුණු පසෙකින් ස්වාමියා විසින් යට දිසාව යැයි කියන ලද දැසි දස් කම්කරුවෝ උවටන් කළ යුතු හ. ඔවුන්ගේ ශක්තියට අනුරූප ලෙස කර්මාන්ත සංවිධාන කිරීමෙන් ද බත් වැටුප් දීමෙන් ද, ගිලන් වූ කල ඔවුනට නිසි උපස්ථාන යොදාලීමෙන් ද, මිහිරි රස බොජුන් (තමා හුදෙකලාව නො වළඳා) ඔවුනටත් දීමෙන් ද සුදුසු කාලයන්හි වැඩෙන් මුදා හැරීමෙන් ද යන පසිනි. ගෘහපති පුත්‍රය, මේ කරුණු පසින් ස්වාමියා විසින් යට දිසාව යැයි කියන ලද දැසි දස් කම්කරුවෝ උවටන් කරන ලද්දාහු මේ කරුණු පසෙකින් ස්වාමියාට අනුග්‍රහ කරත්. ස්වාමියාට පළමුවෙන් ම නැඟී සිටින්නාහු ද වෙත්, ස්වාමියාට පසු ව නිදන්නාහු ද වෙත්, (කිසිත් හොරා නොගන්නාහු) ස්වාමියා දුන් දැය ම ගන්නා සුලු වෙත්, මනා කොට කරන ලද කර්මාන්ත ඇත්තාහු ද වෙත්, ස්වාමියාගේ ගුණ කථාව පතුරුවන්නාහු ද වෙත්. ගෘහපති පුත්‍රය, මේ පස් කරුණින් ස්වාමියා විසින් යට දෙස නැමැති දැසි දස් කම්කරුවෝ උවටන් කරනු ලැබුවාහු, පසු වැ කී කරුණු පසින් ස්වාමියාට අනුග්‍රහ කරත්. මෙසේ ඔහු විසින් මේ යට දිසාව නිරුපද්‍රිත කොට ප්‍රතිභය රහිත කොට හවුරන ලද්දේ වෙයි.

(II) පරහට හිත කැමතිව, අවවාද අනුශාසනා කරන, අකුසලයෙන් වළකා කුසලයෙහි පිහිටුවන, කල්‍යාණ මිතුරු තෙම සත්පුරුෂයන්ට ප්‍රියයි. අසත්පුරුෂයන්ට අප්‍රිය වේ.

පාප මිත්‍රයන් හා අධම පුරුෂයන් සේවනය නොකළ යුතු ය. කල්‍යාණ මිත්‍රයන් හා උත්තම පුරුෂයන් සේවනය කළ යුතු ය.

ලොව්තුරු දහම් රසය වළඳන මහණ තෙම සතර ඉරියව්වෙහි ම සුවසේ වසන්නේ ය. ප්‍රඥාවන්ත තෙම හැම කල්හි ම පහන් සිත් ඇතිව බුද්ධාදි ආර්යයන් විසින් දන්නා ලද සත්තිස් බෝධිපාක්ෂික ධර්මයෙහි ම ඇලෙන්නේ ය.

දියඇළුවෝ තමන් කැමති තැනට ජලය ගෙන යත්. හී වඩුවෝ කැමති ලෙසට හී දඬු නමත්. වඩුවෝ තමන් කැමති පරිදි දැව දඬු නමත්, නුවණැත්තා තමන්ගේ සිත දමනය කරයි.

***(ලකුණු 10 × 2 = 20යි.)***

03. පහත දැක්වෙන වාක්‍ය, රීතිය නොබිඳ පාලියට නගන්න.

I. දෙවා පුඤ්ඤක්ඛයෙන ච ආයුක්ඛයෙන ච දෙවලොකම්හා චවන්ති.

II. භික්ඛු පාතොව පබුජ්ජිත්වා අංගණං සම්මජ්ජති.

III. සබ්බඤ්ඤූ විහාරං ආගතානං සබ්බෙසානං ධම්මං දෙසෙසි.

IV. සබ්බෙ සත්තා අත්තනො කායං පහාය පරලොකං ගච්ඡන්ති.

V. සචෙ තුම්හෙ නිබද්ධං බුද්ධං සරෙය්‍යාථ, තුම්හාකං භයං න උප්පජ්ජන්ති.

***(ලකුණු 4 × 5 = 20යි.)***

04. (i) පහත සඳන් සන්ධි පද විසන්ධි කරන්න.

| | |
|---|---|
| I. තීණි + ඉමානි | II. සබ්බෙ + එව |
| III. යස්ස + ඉදානි | IV. සඤ්ඤා + ඉති |
| V. චක්ඛු + ඉන්ද්‍රියං | VI. අකතඤ්ඤූ + අසි |
| VII. ඡායා + ඉව | VIII. චන්ද + උදය |
| IX. ආබාධිතො + අහං | X. මධු + උදකං |

***(ලකුණු 1 × 10 = 10යි.)***

(ii) පහත සඳහන් සමාස පද කවර සමාසයකට අයත් දැයි නම් කරන්න.

| | |
|---|---|
| I. කම්ධාරය සමාසය | II. කම්ධාරය සමාසය |
| III. කම්ධාරය සමාසය | IV. දිගු සමාසය |
| V. බහුබ්බීහි සමාසය | VI. තප්පුරිස සමාසය |
| VII. ද්වන්ද සමාසය | VIII. බහුබ්බීහි සමාසය |
| IX. බහුබ්බීහි සමාසය | X. අව්‍යයීභාව සමාසය |

***(ලකුණු 1 × 10 = 10යි.)***

05. පහත සඳහන් බාලාවතාර සූත්‍රයන්ට අර්ථ ලියා උදාහරණ 2 බැගින් සපයන්න.

**I. වමොදුදන්තානං -**
ස්වරයක් පර කල්හි මුල් පදයේ අග ඇති 'ඔ' කාරයට සහ 'උ' කාරයට ඇතැම් විට 'ව' කාරයක් ආදේශ වේ.

සො + අස්ස = ස්වස්ස
අනු + එති = අන්වෙති

**II. අබ්භො අභි -**
ස්වරයක් පර කල්හි අභි උපසර්ගයට අබ්භ ආදේශ වේ.

අභි + උග්ගතො = අබ්භුග්ගතො
අභි + අඤ්ඤාසි = අබ්භඤ්ඤාසි

**III. ලොපංච තත්‍රාකාරො -**

බ්‍යඤ්ජනයක් පර කල්හි මුලින් ඇති ස්වරය ඇතැම් විට ලොප් වේ. ඒ ලොප් කළ තැනට 'අ' කාරයක් ආගම වේ.

සො + මුනි = සමුනි

ජානෙම + තං = ජානෙමුතං

**IV. වග්ගන්තං වා වග්ගෙ -**

වර්ග බ්‍යඤ්ජනාක්ෂරයක් පරපදයේ තිබී පූර්ව පදාන්තයේ නිග්ගහීතයක් ඇති විට එම නිග්ගහීතයට පර වූ වර්ග බ්‍යඤ්ජනාක්ෂරයේ වර්ගාන්තාක්ෂරය ආදේශ වේ.

සං + චාර = සඤ්චාර

සං + දෙහ = සන්දෙහ

**V. යවමදනතරළාචාගමා -**

ස්වරයක් පර කල්හි පද මධ්‍යයට ය, ව, ම, ද, න, ත, ර, ල, ග යන අක්ෂර ආගම වේ.

න + ඉමස්ස = නයිමස්ස

ඉධ + ආහු = ඉධමාහු

**(ඉහත සඳහන් සූත්‍රයන්ට ගැළපෙන වෙනත් උදාහරණ ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.)**

***(ලකුණු 4 × 5 = 20යි.)***

06. I. **"නදී"** ශබ්දය සියලු විභක්තිවල වරනගා වගුගත කරන්න.

| විභක්තිය | ඒක වචන | බහු වචන |
|---|---|---|
| පඨමා විභක්තිය | නදී | නදී, නදියො, නජ්ජො |
| ආලපන විභක්තිය | (හෙ) නදී | (හෙ) නදී, නදියො, නජ්ජො |
| දුතියා විභක්තිය | නදිං | නදී, නදියො, නජ්ජො |
| තතියා විභක්තිය | නදියා, නජ්ජා | නදීභි, නදීහි |
| කරණ විභක්තිය | නදියා, නජ්ජා | නදීභි, නදීහි |
| චතුත්ථී විභක්තිය | නදියා, නජ්ජා | නදීනං |
| පඤ්චමී විභක්තිය | නදියා, නජ්ජා | නදීභි, නදීහි |
| ඡට්ඨී විභක්තිය | නදියා, නජ්ජා | නදීනං |
| සත්තමී විභක්තිය | නදියා, නදියං, නජ්ජං | නදීසු |

***(ලකුණු 10යි.)***

II. '√**සු**' ධාතුව සත්තමී ආඛ්‍යාත උභය පදයෙහි වරනගා වගුගත කරන්න.

| පරස්ස පදයෙහි | | |
|---|---|---|
| පුරිස | එක වචන | බහු වචන |
| පඨම පුරිස | සුණෙ, සුණෙය්‍යා | සුණෙය්‍යුං |
| මජ්ඣිම පුරිස | සුණෙය්‍යාසි | සුණෙය්‍යාථ |
| උත්තම පුරිස | සුණෙය්‍යාමි | සුණෙය්‍යාම |

| අත්තනො පදයෙහි | | |
|---|---|---|
| පුරිස | එක වචන | බහු වචන |
| පඨම පුරිස | සුණෙථ | සුණෙරං |
| මජ්ඣිම පුරිස | සුණෙය්‍යාථො | සුණෙය්‍යාව්හො |
| උත්තම පුරිස | සුණෙය්‍යං | සුණෙය්‍යාම්හෙ |

*(ලකුණු 10 × 2 = 20යි.)*

07. I. බුද්දක නිකායට අයත් ග්‍රන්ථ ලියා දක්වා අපදානපාළිය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

II. අභිධර්ම පිටකය සංවර්ධනය වී ඇති ආකාරය පිළිබඳ සටහනක් ලියන්න.

**(අදාළ ප්‍රශ්නයට නිසි කරුණු ගොනු කර ඇත්නම් සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.)**

*(ලකුණු 10 × 2 = 20යි.)*

08. I. පාලි භාෂාව සංවර්ධනය වූ ආකාරය පෙන්වා දෙන්න.

II. පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් පාලි සාහිත්‍යයට කළ සේවාව පෙන්වා දෙන්න.

**(අදාළ ප්‍රශ්නයට නිසි කරුණු ගොනු කර ඇත්නම් සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.)**

*(ලකුණු 10 × 2 = 20යි.)*

*** 